CPA

Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ වරයාට එරෙහි පෝස්ටර් ප්‍රහාරය පිළිබඳව වූ ප්‍රකාශය

***2012 ඔක්තෝබර් 16 වනදා, කොළඹ, ශ්‍රී ලංකාව :*** 2012 ඔක්තෝම්බර් 15 වන සඳුදා කොළඹ නගරයේ අවට ප්‍රදේශවල දක්නට ලැබුනු පෝස්ටරයක් පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය බරපතල සැලකිල්ල හා අවධානය යොමු කරයි. එහි අන්තර්ගත පාඨය වූයේ ***''අඩු ආදායම් ලාභී පවුල් පහලොස් ලක්ෂයක ජීවිත ගොඩනගන ජනතාවාදී දිවිනැගුම පනත රට බෙදන්න උඩගෙඩි දෙන පාක්‍යසෝති නඩයෙන් බේරාගනිමු''***

යන්නයි. පෝස්ටරයේ ඡායාරූප මීට අමුණා ඇත. වර්තමානයේ රජය විවේචනය කරන්නන්ට එරෙහිව සිදුවන දේශපාලන ප්‍රචණ්ඩත්වය හා වරද කරන්නන්ට වාසි සහගතවන දඬුවම් නොලබා වරද කිරීමේ සංස්කෘතිය යනාදිය පිළිබඳ සන්දර්භය තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතා පිළිබඳව එහිවූ බිය එලවන සුළු ඇඟවුම පිළිබඳව වැඩිදුර අවධාරණය කිරීමක් අවශ්‍ය නොවන බව කිව යුත්තක් නොවේ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හා එහි විධායක අධ්‍යක්ෂ වරයාට එරෙහිව වඩාත්ම මෑතකදී එල්ලවූ ප්‍රහාරය මෙයයි. එය කොන්දේසි විරහිතව හෙලා දැකිය යුතුය.

දැනට නීතිගතවීමේ ක්‍රියාදාමයෙහි පවතින දිවිනැගුම කෙටුම්පත් පනත පිළිබඳව පෝස්ටරයෙහි වූ සඳහනෙහි හා පනතෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල භාවය පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදුකල නෛතික අභියෝගයෙහි සන්දර්භය පහත දැක්වෙන පරිදි වේ. 2012 අගෝස්තු 10 වන දින කෙටුම්පත් පනත පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයෙහි ඇතුලත් කළ විට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හා එහි විධායක අධ්‍යක්ෂ වරයා ලෙස ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතා යන දෙපාර්ශවයම විසින් කෙටුම්පත් පනත අභියෝග කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි පෙත්සම් ගොනුකරන්නට යෙදිනි. එමගින් කෙටුම්පත් පනතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන්නාවූ අවස්ථාවන් විය හැකි හරයාත්මක හා ක්‍රියාපටිපාටිමය විෂය පථයයන් ගණනාවක්ම අධිකරණයේ අවධානයට යොමුකරනු ලැබිණි. මෙම කෙටුම්පත් පනතින් අපේක්ෂා කරනු ලබන ක්‍රියාවලියෙහි බලතල බෙදාහැරීමේ මූලධර්මය, පළාත් සභා වලට පවරා දෙනු ලැබූ යම් විෂයයන් ආපසු පවරා ගැනීමේ හැකියාව, මහජන මුදල් පිළිබඳව වූ පාර්ලිමේන්තුවේ පාලනය සහ විධායකය කෙරෙහිවූ පාර්ලිමේන්තුවේ පොදු අධීක්ෂණය සහ තොරතුරු වලට ජනතාවට ඇති ප්‍රවේශය රජය විසින් අත්හිටුවීම වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වශයෙන් සැලකිල්ල යොමු විය යුතු වැදගත් ක්ෂේත්‍රයන් ගණනාවක්ම පවතී. මෙම කරුණු තීන්දුවක් අපේක්ෂාවෙන් දැනට ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියෙහි පවතින බැවින් මෙකී විෂයයන් පිළිබඳව වැඩිදුර අදහස් දැක්වීමට අපි අදහස් නොකරන්නෙමු.

කෙසේ නමුත් ක්‍රියාපටිපාටිමය ගැටළු සම්බන්ධයෙන් අපගේ පෙත්සම් මගින් කියා සිටි කරුණට ශ්‍රේෂ්ඨාධිකරණයේ එකඟත්වය ලැබිණි. එනම් කෙටුම්පත් පනතේ හරයාත්මක අන්තර්ගතය පළාත් සභා වෙත පවරනු ලැබූ විෂයයන් ගණනාවක් කෙරෙහි බලපෑම් ඇති කරවන බැවින් පළාත් සභාවල කැමැත්ත ලබා ගැනීම ඇතුළත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නියම කොට ඇති විශේෂ ක්‍රියාපටිපාටිය අනුව එය සම්මත කරනු ලැබිය යුතු බවය. ශ්‍රේෂ්ඨාධිකරණයේ මෙම තීන්දුවට අනුව රජය විසින් කෙටුම්පත් පනත පළාත් සභා වෙත යොමු කරනු ලැබූ අතර පහසුවෙන් ඒවායින් සම්මත කරගනු ලැබිණි. එහෙත් තේරී පත්වූ පළාත් සභාවක් නොමැති උතුරු පළාත සම්බන්ධයෙන් තත්ත්වය මීට වෙනස් විය. පළාත් සභාව වෙනුවෙන් ආණ්ඩුකාරවරයා විසින් ලබාදුන් කැමැත්ත පිළිබඳව යාපනය

දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් නෛතික අභියෝගයක් ඉදිරිපත් කරනු ලැබ ඇත. මෙහිදී ආණ්ඩුකාරවරයාගේ භූමිකාව පිළිබඳව වූ ප්‍රශ්ණය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමුකරනු ලැබ තිබීම පිළිබඳව වූ කරුණ නොසලකා හරිමින් 2012 සැප්තැම්බර් මස 9 වන දින කෙටුම්පත් පනත දෙවන වරටත් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිණි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ආචාර්ය සරවනමුත්තු මහතා විසින් නැවත වරක් කෙටුම්පත් පනත අභියෝගයට ලක් කරනු ලැබූ අතර එම කරුණ මේ සතියේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සලකා බලනු ලැබීමට නියමිතව ඇත.

මෙම ප්‍රහාරයන්ට අමතරව ඔක්තෝම්බර් 15 වන සඳුදා එනම් පෝස්ටර් දක්නට ලැබුනු දිනයේම උදෑසන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙත ආරක්ෂක හමුදා සාමාජික පිරිසක් පැමිණි බව අප හෙළිදරව් කරන්නෙමු. ආරක්ෂක හමුදා සාමාජිකයන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කාර්යාලයේ සේවයේ නියුතුව සිටි ආරක්ෂක නිලධාරියාට දනුම්දී ඇත්තේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ලිපිනය මැතිවරණ දෙපාර්තමේන්තුවට සම්බන්ධ වන්නක් බව තැපැල් දෙපාර්තමේන්තුව විසින් තමන් හට කියා ඇති බවත් ඒ පිළිබඳව පරීක්ෂා කර බැලීමට තමන් පැමිණි බවත්ය. පෝස්ටර් ගැසීමත් හමුදා සාමාජිකයන් පැමිණීමත් අතර යම් හේතුඵල සම්බන්ධයක් තිබේද? නැතිනම් එය හුදු අහේතුක සම්පාතයක්ද? රටේ පවතින නීතියට අනුව එබඳු පරීක්ෂණයන් සිදු කිරීමේ භූමිකාවක් හමුදාවන් වෙත ලැබෙන්නේ කෙසේ දැයි අවබෝධකර ගැනීමට අප අසමත් වන්නෙමු.

පුද්ගලයෙකු අපවාදයට ලක්කිරීමෙන් හා ඔහුට එරෙහිව ජනතා කෝපය උසිගැන්වීමෙන් ඔබ්බට යන, අපගේ පශ්චාත් යුද දේශපාලන සංස්කෘතියේ සිදුවෙමින් පවතින යම් ගැඹුරු වෙනස්කම් පිළිබඳව වූ ඇඟවීමක් මේ වර්ධනයන් මඟින් පිලිබිඹු කෙරේ දැයි යන්න පිළිබඳව අපගේ සැලකිල්ල යොමුව ඇත. සිවිල් සමාජයේ විවේචනයන් සහ විසම්මුතීන් පමණක් නොව තම බලය වෙත වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පාලනයන් පවා තම න්‍යාය පත්‍රයට පිලිගත නොහැකි දේ ලෙස රජය විසින් වැඩි වැඩියෙන් සලකන බව පෙනෙන්නට තිබේ. එමෙන්ම කුමන ආකාරයක හෝ ප්‍රජාතන්ත්‍රික විසම්මුතියක් වෙත රජය දක්වන පොදු  හා නිරන්තර ප්‍රතිචාරය වී ඇත්තේ තමන්ට එරෙහි වූවන් ලඟ දේශප්‍රේමයක් නොපවතින බවට චෝදනා කිරීමයි. ප්‍රජාතන්ත්‍රවාදයේ සුජාත මූලිකාංගයන් හා ආකාරයන් වන්නේ ජනප්‍රියවාදය (populism) හා බහුතරවාදය (majoritarianism) පමණක් යයි රජය සලකන බව පෙනීයයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්මාණය වී ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව ඊට ඍජුවම ප්‍රතිවිරුද්ධ වූ සංකල්පයන් මත පදනම්ව යයි නැවත නැවතත් කියා සිටීම අවශ්‍ය නොවේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පාලනයන්, සංවරණයන් හා තුලනයන්, නීතියේ ආධිපත්‍යය හා අධිකරණයේ ස්වාධීනත්වය, මූලික අයිතිවාසිකම් සහ සුළුතර ප්‍රජාවන් සඳහා වූ ආරක්ෂණයන්, බලය බෙදීම, උද්යෝගීමත් සහ විවේචනාත්මක ඡන්දදායකයන් හා ජනමාධ්‍ය සහ සිවිල් සමාජය යනාදියෙන් හික්මවනු නොලැබූ මැතිවරණමය ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයන් කිසිඳු ලෙසකින් ප්‍රජාතන්ත්‍රවාදයන් නොවෙතැයි අපි විශ්වාස කරමු. ආර්ථික සංවර්ධනයේ යහපත පිණිස යයි කියනු ලැබූවක් වෙනුවෙන් මෙම මූලික ප්‍රතිපත්තීන් බෙලහීන කිරීම ව්‍යාජ දෙබෙදුමක් වනවා පමණක් නොව 1931 සිට ප්‍රජාතාන්ත්‍රික දිවිමගක කොටසක් ලෙස අප භුක්ති විඳිමින් සිටි තේරීම හා වෙනස් කිරීම පිළිබඳව වූ සම්ප්‍රදායයන් බාදනයට ලක් කිරීමක්ද වෙයි.

ජනප්‍රියවාදී ආධිපත්‍යවාදයේ (Populist Authoritarianism) අවාසනාවන්ත අත්දැකීම ලබා ඇති බොහෝ රටවල ඉතිහාසය පෙන්වා දී ඇති පරිදී, මුල් අවස්ථාවේදී, ජනතාවාදී ප්‍රතිපත්තීන් යයි කියනු ලබන ආකාරයන් මඟින් දේශපාලන බලය වෙත ඇති නෛතික හා දේශපාලනික පාලනයන් දුර්වල කිරීම බිය එලවන සුළු ප්‍රවනතාවයකි. මධ්‍යගතකරණයට හා පාලන යාන්ත්‍රනයන් රහිත බවට රජයයන් හුරු පුරුදුවූ විට වැඩිකල් නොගොස්ම ඒවා ජනතා විරෝධී බවට පත්වේ. මෑතකදී සිදුවූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අයුතු ලෙස උපයෝගී කොට ගැනීම්, ප්‍රජාතන්ත්‍රවාදය හා පාර්ලිමේන්තුව යන දෙකෙහිම අගතියට හේතුවන පරිදි විධායකය ශක්තිමත් කිරීම, යහපාලනය සහතික කිරීම සඳහා වූ හොඳින් ස්ථාපිත විධිවිධානයන් හට හානි පැමිණවීම, දේශපාලන විරුද්ධවාදීන් හට සලකන ආකාරය, විරෝධය දක්වන්නන්ට ක්‍රියාකාරීන්ට හා ජනමාධ්‍යවේදීන්ට එරෙහිවූ ප්‍රචණ්ඩත්වය, බලය යොදා සිදුකරන අතුරුදහන් කරවීම්, අධිකරණයේ ස්වාධීනත්වය වෙත වූ ප්‍රහාරයන්, සිවිල් ජන ජීවිතය හමුදාකරණයට ලක්කිරීම සහ රට පුරා පැතිර පවත්නා දඬුවම් නොලබා වරද කිරීමේ සංස්කෘතිය යනාදී ක්‍රියාවලීන් සැලකිල්ලට ගනිමින් අප නිශ්චිත ලෙසම ක්‍රියා සිටින්නේ විවේචනාත්මක හඬවල් බිහිසුණුකරණය ඇතුළු ක්‍රියාමාර්ග තුළින් තවමත් නොනැසී පවතින ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයන් හා සම්මතයන් කඩාබිඳ දැමීම අරමුණු කොටගත් ක්‍රියාදාමයක් වත්මන් ශ්‍රී ලංකාවේ සිදුවෙමින් පවතින බවය.

අද සිදුවන පරිදී මෙම වර්ධනයන් සැහැල්ලුවෙන් ගැනීම තුළින් සිදුවන්නේ අපගේ ප්‍රජාතන්ත්‍රවාදී අනාගතය අනතුරට ලක්වීමයි.

###

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) පිහිටුවනු ලැබුයේ ශ්‍රී ලංකාවේ ගැටුම් පරිවර්තනය හා යහපාලනය සඳහා ආයතනයන් ශක්තිමත් කිරීමේ හා හැකියා වර්ධනයේ හදිසි අවශ්‍යතාවයක් පවතින බවට හා පක්ෂවාදී නොවන සිවිල් සමාජ කණ්ඩායම් විසින් මෙම ක්‍රියාදාමය වෙත ඉටුකළ යුතුවූ වැදගත් සහ නිර්මාණශීලී දායකත්වයක් පවතින බවට වූ දෘඩ විශ්වාසය පෙරදැරි කොටගෙනය. රාජ්‍ය ප්‍රතිපත්ති විෂයයෙහිදී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙතින් බලාපොරොත්තු වන්නාවූ ප්‍රධාන භූමිකාව පූර්වක්‍රියාකාරී හා මැදිහත්කාරක එකක් වන අතර හිංසාවෙන් තොරවූ ගැටුම් නිරාකරණය හා ප්‍රජාතන්ත්‍රික රාජ්‍යකරණය සඳහා වූ ප්‍රතිපත්ති විකල්පයන් ව්‍යාප්ත කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බලපෑම් කිරීම ඉලක්ක කොට ගත්තක් වෙයි. ඒ අනුව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කාර්යයන් හට, බලපෑම් කරනු ලබන ප්‍රතිපත්ති විකල්පයන් හඳුනාගන්නාවූ හා වර්ධනය කරන්නාවූ ප්‍රධාන පර්යේෂණ සංඝටකයක්ද ඇතුළත් වේ.

Website : www.cpalanka.org
Facebook : www.facebook.com/cpasl
Twitter : www.twitter.com/cpast